"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011-2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011-2092601
ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி / General Telephone - 011-2093000

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No. | CSWP/ADM/18-38/FI/01-2019 | ඔබේ අංකය. / உமது இல. / Your No. | | දිනය. / திகதி. / Date. | 2019-02- 01 |

**පළාත් චක්‍රලේඛ : 01/2019**

ආණ්ඩුකාර ලේකම්(බ.ප),

සභා ලේකම්(බ.ප),

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්(බ.ප),

නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),

පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),

ප්‍රධාන අභ්‍යන්තර විගණක (අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව-බ.ප.),

පරිපාලන නිලධාරි(පාලන),

ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්,

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම සඳහා සහන කාලයක් ලබාදීම.</u>**

2004.01.01. දින සිට 2013.12.11 දින දක්වා කාලසීමාව ඇතුළත රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට පත් වූ සහ එම කාලය තුළ II ශ්‍රේණියට උසස්වීම් ලැබූ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම සඳහා ඔවුන්ගේ පත්වීමේ/උසස්වීමේ දින සිට ඉදිරියට පවත්වන ලද අනුයාත විභාග අවස්ථා හයක් (06ක්) දක්වා සහන කාලයක් පහත සඳහන් විධිවිධානයන්ට යටත්ව ලබා දීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර ඇති බව 2017.02.16 දිනැතිව නිකුත් කරන ලද ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 01/2017 මඟින් දැනුම් දී ඇත. ඒ අනුව එය බස්නාහිර පළාත් සභාවට මෙලෙස අනුගත කර ගෙන ඇත.

02. මීට පෙරාතුව එම නිලධාරීන් සඳහා පොදුවේ අනුයාත විභාග අවස්ථා හතරක (04ක) සහනයක් පමණක් ලැබී තිබූ අතර ඊට පසුව පැවති විභාග අවස්ථාවකදී කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ විට, වැටුප් වර්ධකය විලම්භනය කරන ලදී. එහෙත් ඉහත සහනය හේතුවෙන් අනුයාත විභාග අවස්ථා හයක් (06ක්) දක්වා වැටුප් වර්ධක විලම්භනයවීමකින් තොරව III ශ්‍රේණියට සහ II ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීමට/සම්පූර්ණ කර ගැනීමට නිලධාරීන්ට අවස්ථාව හිමි වන බැවින් එම සහන කාලයට අදාළ වැටුප් වර්ධක උපයා ගැනීමට මෙමඟින් අවස්ථාව හිමි වනු ඇත.

03. ඉහත 02 ඡේදයේ දැක්වූ පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම ප්‍රමාදවීම මත වැටුප් වර්ධක විලම්භනය වීම හේතුවෙන්;

i. බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 96 වැනි වගන්තිය යටතේ පරිවාස කාලය දීර්ඝ කර ඇති III ශ්‍රේණියේ නිලධාරීන් ද

ii. II වන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වීමට නොහැකි වූ නිලධාරීන් ද සහ

iii. ඉහත හේතු මත සාමාන්‍ය කාර්ය සාධනය අනුව වූ II වන ශ්‍රේණියට සහ I වන ශ්‍රේණියේ උස්වීම නියමිත කාලයට වඩා ප්‍රමාද වී ලැබී ඇති නිලධාරීන් ද

මේ යටතේ සිය විලම්භනය වූ වැටුප් වර්ධක සහ ඒ හේතුවෙන් ප්‍රමාද වූ සාමාන්‍ය කාර්ය සාධනය අනුව වූ II වන සහ I වන ශ්‍රේණියේ උසස්වීම් (2005.03.23 දිනැති සේවා ව්‍යවස්ථාවේ 11.3 සහ 12.3 වගන්ති යටතේ සඳහන්) පමණක් යථාවත් කර ගැනීම සඳහා සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ද සහිත ඉල්ලීමක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කළ යුතුය.

04. මෙය අතීතයට ද බලපාන පරිදි සිදු කරනු ලබන සහන සැලසීමක් වන හෙයින් පහත සඳහන් කරුණු අනුව අතීතයේදී අහිමි වූ අවස්ථා පිළිබඳව කිසියම් පිළියමක් වර්තමානයේදී යෙදිය නොහැකි හෙයින් ද එවැනි කරුණුවලදී ගත් අතීත ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි කටයුතු කළ යුතු හෙයින් ද ඒ පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බැලීමට අවකාශ නොමැති බව අවධාරණය කරමි.

i. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය හේතුවෙන් අහිමි වූ වෙනත් සේවාවන්ට පිවිසීමට හෝ උසස්වීම් (2005.03.23 දිනැති සේවා ව්‍යවස්ථාවේ 11.2 සහ 12.2 වගන්ති යටතේ සඳහන්) සඳහා වූ හෝ තරඟ විභාගයන්ට/සම්මුඛ පරීක්ෂණයන්ට හෝ එවැනි කිසියම් තෝරාගැනීමක් වෙනුවෙන් වූ අවස්ථාවක් සඳහා පෙනී සිටීමේ අවස්ථාවක් අහිමිවීම පිළිබඳව සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා

ii. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය හේතුවෙන් අහිමි වූ තනතුරු ලැබීමේ අවස්ථාවන් පිළිබඳ සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා

iii. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනයවීම් හඳුනා නොගෙන/නොසලකමින් සාවද්‍ය ලෙසින් උසස්වීම් හෝ වෙනයම් තරඟ විභාගයන්ට අයදුම්කර ඉන් සමත්ව සම්මුඛ පරීක්ෂණයේ දී හෝ වෙනයම් පසු අවස්ථාවක දී වැටුප් වර්ධක විලම්භනය හඳුනා ගැනීම හෝ සැලකීම හේතුවෙන් අදාළ උසස්වීම හෝ විභාගයේ ප්‍රතිඵල මත කෙරෙන පත්වීම් හෝ වරප්‍රසාදය ලැබීම අත්හිටුවා ඇති නිලධාරීන් විසින් එම අත්හිටවූ පත්වීම්/වරප්‍රසාදය ලබාගැනීමට ඉදිරිපත් කරන අභියාචනා

05. රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APP/4/90/2015 හා 2016.01.19 ලිපියෙන් දන්වා ඇති එම කොමිෂන් සභා තීරණයට අනුව 2004.12.24 දින දක්වා දීර්ඝ කරන ලද ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 01/2009 හි විධිවිධාන යටතේ එදිනට පෙර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්වීම සඳහා විභාග අවස්ථා හයක (06ක) සහනයක් ලබා දී ඇති බැවින් එම සහනය ඉක්මවා මෙම චක්‍රලේඛය මගින් ඔවුනට සහන හිමි නොවේ.

06. ඔබගේ පහසු අවධානය සඳහා රාජ්‍ය කළමනාකරන සහකාර සේවයේ III ශ්‍රේණියට සහ II වන ශ්‍රේණියට අදාළව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වා ඇති දිනයන් පහත දක්වා ඇත.

| III ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වූ දිනයන් | II ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වූ දිනයන් | |
|---|---|---|
| | විභාග දිනය | ඒ.සේ.ව.01/2009 මඟින් පෙරදාතම් කර ඇති දිනය |
| 2007.03.31 | 2007.03.31 | 2005.01.01 |
| 2008.08.30 | 2007.12.08 | 2005.07.31 |
| 2009.07.26 | 2008.10.25 | 2006.01.31 |
| 2010.07.17 | 2009.11.21 | 2006.07.31 |
| 2011.10.01 | 2010.11.13 | 2007.01.31 |
| 2013.01.27 | 2011.12.24 | 2007.07.31 |
| 2014.06.29 | 2013.03.16 | - |
| 2015.09.19 | 2014.05.10 | - |
| | 2015.05.23 | - |

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

__පිටපත__ :

01. ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.) - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.